සන්නස SANNASA

10 වන පිටෙන්

උදයේ උපාසන සීනුව නාද වූ විගස, පන්ති කාමර තුළ සහ පාසල් වත්තේ විසිරී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවෝ දුව විත්, තම පන්ති සගයින් සමග පන්ති අනුපිළිවෙලට උපාසන මළුවේ පෙළ ගැසෙති.

ආචාර්ය මණ්ඩලය උපාසන මළුවේ පැත්තක ඇති උස් බිම් තීරුවේ සිට ගනිති.

ඉන්පසු විදුහල්පති, නියෝජ්‍යවිදුහල්පති වරයෙකු සහ විශේෂ අමුත්තෝ සිටිතොත් ඔවුන්ද, උපාසන පීඨිකාව මතට පැමිණෙති.

මීළඟට ශිෂ්‍ය නායකයින් දෙදෙනෙකු විසින් මහත් භක්තියකින් යුතුව වඩම්මාගෙන එනු ලබන, විද්‍යාලයේ ආචාර්ය ස්වාමීන් වහන්සේ නමක්, පීඨිකාවේ අසුන් ගනිති.

ස්වාමීන් වහන්සේ විසින් පිරිස තිසරණ සහිත පංච ශීලයේ පිහිටුවා, කෙටි අනුශාසනාවක්ද කරති. ඉන්පසු, විදුහල්පති තුමාගේ කෙටි දේශනයකින් මූලික කටයුතු නිමාවට පත්වේ. විදුහලට පැමිණෙන විශේෂ අමුත්තෝද බොහෝ විට සිසුන්ට දැක ගැනීම පිණිස උපාසන පීඨිකාවට කැඳවනු ලබති. සමහර අවස්ථාවලදී විශේෂ අමුත්තෝද සිසුන් අමතති.

විද්‍යාලයයේ පැවැත්වූ උත්සවයක් සඳහා, එසේ පැමිණි සුවිශේෂී අමුත්තන්ගේ ඡායාරූපයක් පහත දැක්වේ.


1956, වසරේදී, ශ්‍රීපාලියේ පැවැත්වූ උත්සවයකට සහභාගී වූ (වමේ සිට දකුණට) හොරණ පාර්ලිමේන්තු මන්ත්‍රී සාගර පලන්සූරිය, ස්වදේශ කටයුතු භාර ඇමති ඒ.ජී. ජයසූරිය, අග්‍රාමාත්‍ය ඒස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, විල්මට් ඒ. පෙරේරා සහ භාරතයේ ආචාර්යඨ සර්වපල්ලි රාධාක්‍රිෂ්ණන් යන සම්භාවනීය අමුත්තෝ, උපාසක පීඨිකාවේ අසුන්ගෙන සිටිති.

උපාසනය අවසන් වනුයේ තවත් අති රමණීය ශිෂ්‍ය සංදර්ශනයකින්ය. විදුහල්පතිතුමා විසින් දිනයේ උපාසනය අවසන් බව නිවේදනය කළ විගසම, සිසුහු සියල්ලෝම සිව් දෙනා බැගින් පෙළ සෑදී, තාගෝර් තුමා විසින් බෙංගාලි භාෂාවෙන් රචිත 'අධ්‍යාපනයේ මිහිර' දනවන ගී කිහිපයක් සහ එම තනු වලටම අදාලව, සිංහලෙන් සකස් කළ දේශීය ගී කිහිප යක්ද, ගයමින් උපාසන මලුව වටේ සහ ඉන් ඔබ්බෙහි ඇති සක්මන් මගෙහි ගොස් විදුහලේ 'නිමාලනී' ප්‍රධාන ශාලාව ඉදිරිපිට සීරුවෙන් සිට ගනිති.

මෙහි සිට සියලු දෙනාම විදුහලේ සිසුවන්ගේම වයලීන සහ බටනලා වාදනය කට අනුව, පාසැල් ගීය සහ ජාතික ගීය ගායනා කර, විදුහලට ආවේනික උරුමයක් වන උපාසනය අවසන් කර තම පන්ති කරා පිය නගති.

මා, ප්‍රදේශයේ අධ්‍යාපන නිලධාරිවරයෙකු ලෙස සේවය කරන කාලයේ, ශ්‍රීපාලියේ විදුහල්පතිව සිටි, ගාමිණි ගුණරත්න මහතා මගේ කුළුපග මිත්‍රයෙකි. ඔහුගේ කාරුණික ඇරයුම පරිදි, කිහිප අවස්ථාවකදීම විදුහලට ගිය මම, 'උපාසනය' රිසි සේ නරඹා මහත් සතුටට පත්වී ඇත්තෙමි.

1962 වසරේ උපකෘත පාසල් රජයට පවරා ගැනීමේදී, ශ්‍රීපාලි ආයතනයේ විද්‍යාල අංශය පමණක් රජයට ලබාගෙන, එය ද්විතිය විදුහලක් බවට පත් කරන ලදී. ශ්‍රීපාලි විද්‍යාලයය අද ජාතික පාසලකි. රජයට පවරා නොගත් ශ්‍රීපාලි නමින්ම හැඳින්වූ පෞද්ගලික මට්ටමෙන් ඉදිරියටත් සංවර්ධනය වූ කළා ශිල්ප සහ සෞන්දර්ය අධ්‍යාපන ආයතනය, භාරතයේ ශාන්ති නිකේතන ආකෘතියේ කලායතනයක් ලෙස ප්‍රකට විය. පසුව, 1996 වසරේදී, මෙම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයයේ සෞන්දර්යය පීඨය ලෙස විශ්ව විද්‍යාල පද්ධතියට සම්බන්ධ කරගන්නා ලදී. අද එය සෞන්දර්යය සහ කළා ශිල්ප උපාධිය ද, ලබාදෙන විශ්ව විද්‍යාලයයකි. ශ්‍රීපාලි කළා ශිල්ප සහ සෞන්දර්යය ආයතනය විශ්ව විද්‍යාල තත්ත්වයට පත්වීමෙන් පසුව, එම පරිශ්‍රමයේම ස්වාධින ආයතනයක් ලෙස, දිනෙන් දින දියුණුවෙන් දියුණුවට පත්වෙමි න් තිබේ. ශ්‍රීපාලියේ නිර්මාතෘ විල්මට් ඒ පෙරේරා මැතිතුමා 1973 වර්ෂයේදී අභාවප්‍රාප්ත විය. එතුමාගේ සෞන්දර්යය විශ්ව විද්‍යාල සිහිනය සැබෑ කරමින් 1996 වසරේදී, ශ්‍රීපාලි ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයයේ සෞන්දර්යය පිඨය ලෙස ස්ථාපිත කිරීම එතුමාගේ අනාගත දැක්ම වෙනුවෙන් කරනලද මහත් කෘතගුණ සැලකීමක් ලෙස දැක්විය හැකිය.

එමෙන්ම, ඉතාමත් ප්‍රබල සෞන්දර්යය අංශයක් සහ ද්විතීය විදුහලක තිබියයුතු අනිකුත් සියලුම අධ්‍යයන අංශ වලින් සමන්විත ශ්‍රීපාලි විද්‍යාලයයේ, දශක හතක පමණ කාලයක සිට නොකඩවා ගෙන ආ 'උපාසනයී නම් චමත්කාරජනක උදය රැ ස්වීම, සම්ප්‍රදායික ආකාරයටම ගෙනයාම පිළිබඳව, එයට සම්බන්ධවන සියලු දෙනාටම ප්‍රණාමය පුද කෙරේ.

**(ඡායාරූප, ස්තුති පූර්වකව, ශ්‍රීපාලි විදුහලේ ආදී ශිෂ්‍ය නයන මධුවන්ත වීරසේකරගේ ෆේස් ඉදදන සටහනකිනි. සමූහ ඡායාරූප ශ්‍රීපාලි සමරු කලාපයකිනි.)**






නීතිවිරෝධීව ඉන්දියාවෙන් ලංකාවට රැගෙන ආ බවට සැකකරන හඳුනා නොගත් පෙති වර්ගයක් සමඟ ඒවා ඇසුරුම් කරන හිස් පැකට් විශාල ප්‍රමාණයක් කැලණි ගඟට දැමීමට උත්සාහ කරන ලදැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් මුල්ලේරියාව පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන කඩුවෙල අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ කාන්තාවක් ඇතුළු මුස්ලිම් ජාතිකයන් තිදෙනෙක් රුපියල් ලක්ෂ 02 බැගින් වන ශරීර ඇප හා දැඩි කොන්දේසි යටතේ මුදාහැරීමට මහෙස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු ප්‍රසන්න අල්විස් මහතා නියෝග කළේය.

එම සිද්ධිය දුටු බව කියන පුද්ගලයකු විසින් මුල්ලේරියාව පොලිසියට ලබා දී තිබූ තොරතුරු මත වහා ක්‍රියාත්මක වූ පොලිස් මූලික විමර්ශන පවත්වා ඔවුන් තිදෙනා අත්අඩංගුවට ගෙන ඇත. පොලිසියට ලැබුණු එම තොරතුරු අනුව නාඳුනන පිරිමි පුද්ගලයෙක් කාන්තාවක සමඟ කැලණි ගං තීරයට පැමිණ සැකකරු යමක් ගඟට දැමීමට සූදානම් වූ බවත් ඒ ගැන විමසීමට යැමේදී ඔවුන් කලබල වී පලා යැමට උත්සාහ කර ඇතැයි තොරතුරු ලබාදුන් අය පොලිසියට ප්‍රකාශ කර ඇත.

වහා ක්‍රියාත්මක වූ පොලිසිය ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී උපත් පාලන පෙති බවට සැකකරන පෙති 20 ක් හා ඒවා බහාලන ඇසුරුම් 840 ක් පොලිසිය භාරයට ගන්නා ලද බව පැමිණිල්ල අධිකරණගත කරමින් කියා සිටියේය. ඒ සම්බන්ධයෙන් ප්‍රධාන සැකකරුගේ බිරිඳ බව කියන තැනැත්තියක් ද තවත් පුද්ගලයකු ද අධිකරණයට ඉදිරිපත් කරන ලදී.

සැකකරුවන් වන්නේ ශාවුල් හමීඩ් මොහොමඩ් මුන්මලේ මොහොමඩ් සල් මොහොමඩ් පසාර් හා අයේෂා පෂාර් යන තිදෙනාය.

මෙහිදී පොලිසිය භාරයට ගන්නා ලද පෙති ඖෂධ වර්ගය ජාතික ඖෂධ පාලක මණ්ඩලයට යවා විශ්ලේෂණ වාර්තාවක් ලබාගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට පොලිසියට නියෝග කළ විනිසුරුවරයා සැකකරුවන් තිදෙනා ඉහත කී ඇප කොන්දේසි යටතේ මුදාහරින ලදී.

තවද සතියේ සෑම සෙනසුරාදා දිනකම මුල්ලේරියාව පොලිසිය හමුවේ පෙනී සිටින ලෙසට ද අධිකරණයට සැකකරුවන්ට නියෝග කෙරිණ.

**පියදාස රණසිංහ**
දිවයින 2019 මැයි 25